# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.02. 11 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (පාලන) 02/2022

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>ප්‍රධාන ලේකම් චක්‍රලේඛ හා උපදෙස් ලිපි නිකුත් කිරීමේ නව ක්‍රමවේදය සම්බන්ධවයි.</u>**

ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් පළාත් රාජ්‍ය ආයතන වෙත නිකුත් කරනු ලබන ප්‍රධාන ලේකම් චක්‍රලේඛ, උපදෙස්, අයදුම්පත් යනාදිය ලිපි මගින් ඔබ ආයතන වෙත එවීම මේ දක්වා සිදු විය.

02. රාජ්‍ය සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා අන්තර්ජාලය හා තොරතුරු තාක්ෂණික භාවිතය ප්‍රවර්ධනය වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියක් ද වන බැවින් සහ රාජ්‍ය වියදම් සහ කාලය කළමණාකරණය කර ගැනීමේ අරමුණින් 2022.03.01 දින සිට ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් නිකුත් කරනු ලබන ප්‍රධාන ලේකම් චක්‍රලේඛ, උපදෙස් ලිපි, අයදුම්පත්, දැන්වීම් ආදිය ඔබ ආයතන වෙත ලිපි මගින් එවීම වෙනුවට එකී ලිපි ලේඛන වල පිටපත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියට (www.cs.sp.gov.lk) උඩුගත (Upload) කිරීමට තීරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

03. ඒ අනුව 2022.03.01 දිනෙන් ඉදිරියට ප්‍රධාන ලේකම් චක්‍රලේඛ, උපදෙස් ලිපි, හා පළාත් සභාව තුල සියලු ආයතන සඳහා පොදුවේ අදාළ වන ලිපි, අයදුම්පත්,දැන්වීම් ආදිය ප්‍රධාන ලේකම් කාර්යාලයේ උක්ත වෙබ් අඩවිය හරහා ලබා ගැනීමට කටයුතු කරන මෙන් අවධාරණය කරමි.

04. වෙබ් අඩවිය පරිශීලනයේ දී මතුවන තාක්ෂණික ගැටළු සම්බන්ධයෙන් පහත නිලධාරීන් විමසා කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

- සහකාර ප්‍රධාන ලේකම් (පාලන) - 0718212252 / 0914946971
- පරිගණක වැඩසටහන් සම්පාදිකා - 0914946367

**ආර්. සී. ද සොයිසා**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**ආර්. සී. ද සොයිසා**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**

පිටපත්-

01. සියලුම අංශ ප්‍රධානීන් (ආයතන, පිරිස්, ගිණුම්, ගිණුම් හා ගෙවීම්, සැපයුම්, අයවැය, අභ්‍යන්තර විගණන, සංවර්ධන, නීති, සංඛ්‍යාලේඛන අංශ) - අ. ක. ස.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"